# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

10 ශ්‍රේණිය | සිංහල භාෂාව | ඒකකය 9 - කර්තෘ කාරක වාක්‍ය සහ කර්ම කාරක වාක්‍ය

(1) කර්තෘ කාරක වාක්‍යයක දක්නට ලැබෙන ලක්ෂණ ලියන්න.

(2) පහත දැක්වෙන කර්තෘ කාරක වාක්‍යය කර්මකාරකයට හරවා ලියන්න.

i) ගොවියෝ ගවයන් බඳිති.

ii) මවුපියෝ දරුවන් යහමඟ යවති.

iii) වෛද්‍යවරයා රෝගීන් පරීක්ෂා කළේය.

iv) මම ගෙයක් සාදමි.

v) මිනිසා ගෙයක් සෑදීය.

(3) කර්ම කාරක වාක්‍යයක දක්නට ලැබෙන ලක්ෂණ ලියන්න.

(4) පහත දැක්වෙන කර්ම කාරක වාක්‍යය කර්තෘ කාරකයට හරවා ලියන්න.

i) වෛද්‍යවරුන් විසින් රෝගීහු සුවපත් කරනු ලැබූහ.

ii) මව විසින් පුතා රකින ලදී.

iii) ගං වතුර විසින් ගෙවල් ද පාරවල් ද යට කරන ලදී.

iv) ගෙවිලිය විසින් කුකුළු පැටව් ආරක්ෂා කරනු ලැබෙති.

v) කුරුල්ලන් විසින් කැදලි කරා පියාසර කරන ලදී.

- පහත දක්වා ඇති වාක්‍ය තුළ ඇති විශේෂ වාක්‍ය රීතිය පාඩමෙන් සොයා ලියන්න.

1) ඔහු ලේඛකයෙක් ලු.

2) අපි නීතිගරුක පුරවැසියෝය.

3) නුඹලා අනාගත නායකයෝ ද?

4) අපි සියල්ලෝම ශ්‍රී ලාංකිකයෝ වෙමු.

5) මිනිසුන් අවංක නොවන්නේ ඇයි?

6) සිසුහු පන්තියේ ඇත.

7) සිසුන් පන්තියට පැමිණ ඇත.

8) මා සිරිපා කරුණා කර ඇත.

9) ඕ තොමෝ ගමට ගියාය.

10) සභා තුමූ විසිර ගියහ.

11) සභා තෙමේ විසිර ගියෝය.

සැකසුම:-

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk